# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/52 – 2018 ඔක්තෝබර් 04 වැනි බ්‍රහස්පතින්දා – 2018.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩ පත්තුව සුළු කොට්ඨාසයේ ඉද්දගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ක. 3122 හා 1997.03.03 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.6187 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – වෝගන්වත්ත (පහළ කොටස) – ප්‍රමාණය: හෙක්. 1.6187**

උතුරට: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වෝගන්වත්ත (පහළ කොටස) හි. පි. 235866; නැගෙනහිරට: ඩී. ජේ. මුණසිංහ සහ තවත් අය හිමිකම් කියන මාස්ලියද්ද, පිළිවෙලින් එම්. බී. ඇක්මන් සහ තවත් අය, කේ. වී. රිචඩ් සහ තවත් අය, කේ. වී. ජයරත්න, අයිතිකරු ඉදිරිපත් වී නැත, පී. ටී. ඩයිලියස්, නීල් වික්‍රමආරච්චි, ඕ. ඩබ්. හේරත්, නීල් වික්‍රමආරච්චි, ඩබ්. ඒ. නන්දසිරි හිමිකම් කියන දඩුගොඩවත්ත පිළිවෙලින් සිසිර කුමාර සේනාරත්න සහ තවත් අය සහ ප්‍රේමසිරි සිල්වා හිමිකම් කියන වෙරළුගහලන්ද සහ මතුගම - ඉද්දගොඩ ගම්සභා මාර්ගය; දකුණට සහ බටහිරට: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වෝගන්වත්ත (පහළ කොටස) හි. පි. 235866.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2001/වීඊපී/268.
2018 අගෝස්තු මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 991



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ දියබුබුල (ඊ 352 එෆ්) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ 10 වැනි කොට්ඨාසය දියබුබුල (මාතලේ මහ නගරසභා සීමාව තුල) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/එම්ටීඑල්/2017/628 හා 2017.12.08 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර ''ඒ'' – ගාඩ්න් ඔෆ් ඊඩ්න් (වරිපනම් අංක 25) – ප්‍රමාණය: හෙක්. 0.1391 ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ සිරපුඩීන් රෆීනා උම්මා හිමිකම් කියන ගාඩ්න් ඔෆ් ඊඩ්න් (ව. අ. 25 නාගොල්ල පාර); නැගෙනහිරට: සිරපුඩීන් රෆීනා උම්මා හිමිකම් කියන ගාඩ්න් ඔෆ් ඊඩ්න් (ව. අ. 25 නාගොල්ල පාර) සහ සැක්ස්ටන් පාර්ක්; දකුණට: සැක්ස්ටන් පාර්ක් සහ ජයිත්‍ර මාබ්දීන් මොහොමඩ් නාරීන් හිමිකම් කියන ගාඩ්න් ඔෆ් ඊඩ්න් (ව. අ. 25 නාගොල්ල පාර); බටහිරට: ජයිත්‍ර මාබ්දීන් මොහොමඩ් නාරීන් හිමිකම් කියන ගාඩ්න් ඔෆ් ඊඩ්න් (ව. අ. 29 නාගොල්ල පාර) සහ මාර්ගය (මා.සං.අ).

ගයන්ත කරුණාතිලක,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/313.<br>
2018 ජූලි මස 22 වැනි දින,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>
''මිහිකත මැදුර'',<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

10 - 992

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.